යම් පුවතකට සෘජුවම අදාළ නොවන අවස්ථාවන් හිදී මාධ්‍ය විසින් පුද්ගලයන්ගේ වාර්ගිකත්වයන් සඳහන් නොකළ යුතු බව මාධ්‍ය ආචාර ධර්මයන්හි සඳහන් වේ. එයට හේතුව වන්නේ, එසේ සෘණාත්මක සන්දර්භයන් තුළ යම් වාර්ගිකත්වයක් දිගින් දිගටම ඉස්මතු කිරීම ඔස්සේ, එම වාර්ගිකත්වය සෘණාත්මකව ඒකාකෘතික වීමට (negatively stereotype) ඇති හැකියාවයි.

එම පසුබිම් කර ගනිමින්, බාලවයස් ලිංගික අපයෝජනයක් සම්බන්ධව මව්බිම සහ දිනමිණ පුවත්පත් තුළ (ජනවාරි 03, 2023) පළවූ මෙම වාර්තාවන් විමසා බලමු.

මෙම පුවත් දෙකෙහිම අන්තර්ගතය තුළ, අපරාධයට සම්බන්ධ සැකකරුවන් දෙදෙනා "දෙමළ ජාතිකයන්" බව ඉස්මතු කර තිබේ.

1) මෙම සැකකරුවන් දෙදෙනාගේ වාර්ගිකත්වය, මෙම පුවතට අදාළ වේ යැයි ඔබ සිතන්නේද?

2) ඔවුන්ගේ වාර්ගිකත්වය පුවතට අදාළ නොවන්නේ නම්, එම අදාළ නොවන වාර්ගිකත්වය සඳහන් කිරීම ඔස්සේ, මෙම පුවත්පත් මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් සිදුකර ඇතැයි ඔබ නොසිතන්නේද?

අදාළ නොවන තැන වාර්ගිකත්වයන් සෘණාත්මකව ඉස්මතු නොකරමු!
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම් ඔබ දකිනා මාධ්‍ය ආචාර ධර්ම කඩකිරීම් මෙම Google පෝරමය (https://forms.gle/u5a5n5dJPDerh3Le7) පිරවීම මගින් අපිට එවන්න. නැතිනම් එම මාධ්‍ය ආචාර ධර්ම කඩකිරීම් අපගේ සමාජ මාධ්‍ය පර්යන්තයන් හරහා අප වෙත එවන්න.

